C
332
SAT



# ශ්‍රී ලංකාවේ මුදල් ඉල්ලුම පිළිබඳව කෙරෙන ආනුභවික අධ්‍යයනය

[1978(i) - 2003(iv)]

# AN EMPERICAL STUDY OF DEMAND FOR MONEY IN SRI LANKA

[1978(i) - 2003(iv)]

UNIVERSITY OF PERADENIYA
31 OCT 2008
SENIOR ASSISTANT REGISTRAR
EXAMINATIONS
FACULTY OF ARTS

දර්ශනපති උපාධි පර්යේෂණය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය

University of Peradeniya
21 JUN 2011
Library

648547

# කර්තෘ ප්‍රකාශය

**මෙම පර්යේෂණ නිබන්ධය හෝ එහි කිසයම් කොටසක් හෝ ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට හෝ වෙනත් කිසිදු ආයතනයකට ඉදිරිපත් කර නොමැති බවටත්, වෙනත් මූලාශ්‍ර වලින් ලබාගත් කරුණු සම්බන්ධයෙන් අදාල ආශ්‍රිත නියමාකාරයෙන් දක්වා ඇති බවටත් මෙයින් සහතික කරමි.**


එච්. ඩී . බී. සතරසිංහ

GS/M/Phil/96/97/99

ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව

ශාස්ත්‍ර පීඨය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පේරාදෙණිය

ශ්‍රී ලංකාව


.................... 12.02.2009

අත්සන දිනය

## සාරාංශය

මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාව සඳහා 1978(1) සිට 2003(iv) දක්වා කාලය ආවරණය වන පරිදි මුදල් ඉල්ලුම් සම්බන්ධතාව කවරක්ද යන්න අධ්‍යයනය කිරීම සඳහා ගනුලැබූ උත්සාහයක් වෙයි.

නිබන්ධයේ අරමුණු සහ කල්පිතයන්ට එකඟව කෙටි කාලීන තොග ගැලපුම් ආදර්ශය අඩුතම වර්ග නිමාන ක්‍රමය යටතේ අධ්‍යයනයට යොදවා ගනිමින් ආනුභවික අධ්‍යයනය සිදු කෙරිනි.

මුදල් ඉල්ලුම් ආදර්ශය ගොඩනැගීමේදී මීට පෙර කර ඇති බොහෝ ආනුභවික අධ්‍යයනයන් විසින් බහුලව යොදවාගෙන ඇති ආදායම, දේශීය පොළී අනුපාතය යන විචල්‍යයන්ට අමතරව ශ්‍රී ලංකාව වැනි අඩු දියුණු රටවල මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන බවට සැක පහල කළ හැකි ණය අවහිරතාවයේ තරම නිරූපණය කිරීම සඳහා විචල්‍යයක් ද, ප්‍රථම වතාවට මුදල් කරණයේ බලපෑම නියෝජනය කිරීම සඳහා විචලයයක් ද බාහිර බලපෑම හසුකර ගැනීම සඳහා විචල්‍යයක් ද එකතු කරමින් මෙම ආදර්ශය තව දුරටත් දීර්ග කර ඇත.

අධ්‍යයනයේ ආනුභවික සොයාගැනීම් අනුව අනාවරණය වූයේ මූර්ත ආදායම, අපේක්ෂිත උද්ධමන අනුපාතය, කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් වට්ටම් අනුපාතය, ණය අවහිරතාවේ තරම සහ බාහිර බලපෑම් හසුකර ගැනීමට යොදවාගත් මූර්ත සඵල විනිමය අනුපාතය ශ්‍රී ලංකාවේ මුදල් ඉල්ලුමේ ප්‍රධාන නිර්ණායක විචල්‍යයන් වන බවයි. එහෙත් මුදල්කරණයේ බලපෑම සොයා බැලීම සඳහා යොදවාගනු ලැබූ විචල්‍යය වන වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව සතුටුදායක ප්‍රතිඵල නොපෙන්වීය. තවද ශ්‍රී ලංකාවේ මුදල් රාශිකරණයේ අපේක්ෂිත මට්ටම සහ සත්‍ය මට්ටම අතර ගැලපුම් විලම්භයක් පවතින බව ප්‍රතිඵල මගින් අනාවරණය විය.

සමස්ථයක් වශයෙන් මෙම අධ්‍යයනයේ දී කල්පිතයන් 7ක් පිහිටුවාගත් අතර ඉන් එක් කල්පිතයක් හැර අනෙකුත් සියළුම කල්පිතයන් පිළිගත හැකි මට්ටමක පැවතිණි.